# මොරවක් කෝරලයෙහි ඉපැරණි ශිලාලිපි හා සන්නස් පිළිබඳ අධ්‍යයනයක්

එච්. එන්. චාමර[1]

මොරවක් කෝරලය ආශ්‍රිත පුරාණ සිංහල සමාජයේ සමාජ ආර්ථික තොරතුරු අනාවරණය කරගැනීමේ දී සෙල්ලිපි හා සන්නස් ප්‍රධාන මූලාශ්‍රයයක් වශයෙන් සැලකිය හැකි ය. පුරාණ අක්ෂරවලින් ලේඛනගත කරන ලද සෙල්ලිපි, තඹ සන්නස්, තල්පත් යනාදි ලිපි දකුණු ලක මොරවක් කෝරලය ආශ්‍රිත ව හමු වී ඇත. සන්නිවේදන කටයුතු සඳහා පමණක් නො ව, එවකට ප්‍රදාන, වරදාන ලියා තැබීම සඳහා ද මේ ලිපි භාවිත කර තිබේ. පනාකඩුව තඹ සන්නස, බෙරලපනාතර රජමහා විහාර සන්නස, ගණේගොඩ රජමහා විහාරය හා සම්බන්ධ අත්ලිපි මෙහි දී වැදගත් වේ. ගැටබරු රජමහා විහාර සෙල්ලිපිය ඇතුළු මොරවක් කෝරලය ආශ්‍රිත සෙල්ලිපි දහයක් පමණ කඹුරුපිටියේ වනරතන හිමියන් විසින් කියවා ඇත. මොරවක් කෝරලයේ දැනට විද්‍යමාන පූර්වෝක්ත සෙල්ලිපි හා අත්ලිපි ආශ්‍රයෙන් තත්කාලීන ලංකාවේ සමාජ, දේශපාලන, ආර්ථික හා ආගමික තොරතුරු ගවේෂණය කිරීම මේ පර්යේෂණයේ අරමුණ යි. මොරවක් කෝරලයේ සෙල්ලිපි පිහිටි ස්ථාන කරා ගොස් ඒවා නිරීක්ෂණයෙන් ද මේ සම්බන්ධ ව මෙතෙක් ලියා ඇති සාහිත්‍යික හා ඓතිහාසික මූලාශ්‍රය පරිශීලනයෙන් ද අනාවරණය කරගත් පරිදි රාජකීයයන් මෙන් ම පොදු ජනතාව හා සම්බන්ධ ආර්ථික සමාජ තොරතුරු ද මොරවක් කෝරලයේ සෙල්ලිපි හා අත්ලිපිවලින් හෙළි වන බව හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ මොරවක් කෝරලය, සෙල්ලිපි, අත්ලිපි, තල්පත්, සන්නස්**

[1] සිංහල අධ්‍යයනාංශය